
## සවිකිරීමට උපදෙස්

### ෆිනිෂින් වහල සඳහා





1. අඩි 2ක පරතරයකින් යුතුව ප(ර්)ලින් (පරාල) සවිකළ යුතු වේ.

2. ප(ර්)ලින් (පරාල) මත ෆිනිෂින් ෂීට් ඇතිරීම වහලේ පහළ කෙළවරේ සිට ඉහළට සිදු කළ යුතුය.

3. ෂීට් පරාලයට සවිකිරීම සඳහා හිස පැතලි ඇණ (Jaguar nail) භාවිතා කල යුතුය.

4.ෆිනිෂින් වහල සඳහා ***i-Panel*** ෂීට් ඇතිරීම සිදුවන අවස්ථාවේදීම ෆොයිල් මඟින් ආවරණය කිරීම සහ වහල ආවරණ ඇතිරීම සිදු කල යුතුය.(සෙවිලි කිරීමට යොදාගන්නා නිෂ්පාදන අනුව ෆොයිල් හි ඝනකම තීරණය වේ.)

### පැතලි සිවිලිමක් සඳහා




1. අඩි 2 ක පරතරයකින් යුතුව GI Channel හරස් අතට සවිකරගත යුතුය.

2. එසේ හරස් අතට සවිකරගත් GI Channel, සෑම අඩි 4 ක පරතරකින් යුතුව GI ආධාරකය මඟින් එල්ලීම සිදුකරගත යුතු වේ.

3. ***i-Panel*** ෂීට් GI Channel සමඟ Pop Rivet ආධාරයෙන් සම්බන්ධ කරගත හැකි අතර එක් කෙළවරක සිට සවි කරගැනීම ආරම්භ කල යුතුය.

4. අවම වශයෙන් 25mmx35mmx25mm ප්‍රමාණයෙන් හා 0.40mm හෝ ඊට වඩා වැඩි ඝනකමකින් යුත් GI Channel භාවිතා කල යුතුය.

5. වහලය හා සිවිලිම අතර දුර ප්‍රමාණය අඩි 2ට වඩා අඩුනම් ඇලුමිනියම් ෆොයිල් භාවිතා කිරීම අනිවාර්ය වේ.



### *i-Panel* සිවිලිමට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීම.

- නිෂ්පාදන සම්බන්ධව ගැටළු තිබේ නම්, එය අදාළ ඉන්වොයිසිය සහ සේවා කාලය සඳහා වන සහතිකය සමඟ ප්‍රදර්ශනාගාරය වෙත දැනුම් දිය යුතුය.
- පැමිණිල්ල භාරගනු ලබන්නේ ලබාගත් i-Panel සේවා කාලය සඳහා වන සහතිකය අදාළ නිෂ්පාදනයට සහ අනෙකුත් ලියකියවිලිවලට ගැලපෙන්නේ නම් පමණි.
- සේවා කාලය සඳහා හිමිකම් පෑමට යටත්ව නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහාසමාගම සතු අයිතිය රඳවා තබා ඇති අතර පැමිණිල්ල පරීක්ෂා කිරීම සඳහා සමාගමේ නියෝජිතයාට උපරිම සහයෝගය ලබා දිය යුතුය.
- පැමිණිලි කරන ලද, i-Panel නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා සමාගම 100%ක අධිකාරියක් රඳවා තබා ඇති අතර, පාරිභෝගිකයා එම පරීක්ෂාවන් සඳහා සහභාගී වන නිලධාරීන්ට උපරිම සහයෝගය ලබා දිය යුතුය.
- පැමිණිල්ල ඉදිරිපත් කිරීමේදී යොමු අංකයක් ලබා ගැනීම අනිවාර්ය වන අතර, එය පැමිණිල්ලට අදාළ සියලු ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් කළ යුතුය.
- පරීක්ෂා කිරීමෙන් පසු සමාගම විසින් ගන්නා අවසන් තීරණයට අනුව ඉන්වොයිසියට අදාළ වටිනාකමට මුදල් හෝ සවිකිරීමේ පිරිවැය කිසිසේත්ම නොගෙවන අතර, ඒ වෙනුවට ලබා දෙන්නේ ඉන්වොයිසියට අදාළ නිෂ්පාදන පමණී.
- i-Panel නිෂ්පාදන සම්බන්ධ පැමිණිලි, ඔබ භාණ්ඩ මිලදීගත් වෙළඳ මහතා හරහා ප්‍රධාන කාර්යාලයට දැනුම් දීම අනිවාර්ය වේ.
- පැමිණිල්ල පිළිබඳ ආයතනය විසින් ලබාදෙන තීරණය වන අතර එය පාරිභෝගිකභවතා විසින් භාරගත යුතු වේ.



# Installation Guidelines & Warranty Conditions

i-Panel®



Lead Free
Energy Saving
Healthy Living
Environment Friendly

## සේවා කාලය සඳහා අදාළ කොන්දේසි

(1) i-Panel අඟල් 8 සඳහා පමණක් සේවා කාලය සහ කොන්දේසි  අදාළ වේ.

(2) i-Panel අඟල් 8 තොග මිලදී ගත් දින (ඉන්වොයිසියේ සඳහන් දින) සිට උපරිම ඉදිරි **වසර 05** කාල සීමාවක් දක්වා සේවා කාලය සඳහා වන සහතිකය වලංගු වේ.

(3) නිෂ්පාදනයේ පිටුපස i-Panel වෙළඳ නාමය මුද්‍රණය වී තිබිය යුතුය. එසේ නොමැතිනම් සේවා කාලය වලංගු නොවේ.

(4) සේවා කාලය සඳහා හිමිකම් ඉල්ලුම් කිරීමේදී ශාඛාව විසින් මුද්‍රා සහ අත්සන් කරන ලද ඉන්වොයිස් පත්‍රයේ මුල් පිටපත අනිවාර්යෙන් ඉදිරිපත් කල යුතුය.

(5) පැමිණිලි ලිඛිත සාක්ෂි සහ ඡායාරූප සහිතව මිලදී ගත් ශාඛාව හරහා ඉදිරිපත් කල යුතු අතර, පැමිණිල්ලකට ආදාළ නිෂ්පාදනයේ දෝෂ වල සත්‍යය අසත්‍යය භාවය සහ තත්ත්වය නිශ්චිත වශයෙන් පරීක්ෂා කිරීම Idea Industries ආයතනය සතු වේ.

(6) සේවා කාලය සඳහා හිමිකම් කීමේදී, භාණ්ඩ ආපසු ලබා දීමකදී ලබා දෙනු ලබන්නේ මිලදී ගත් දින සිට පිරිවැය මත ක්ෂය වෙන් කිරීමකට (Depreciation) පසුවයි. එම තීරණය ආයතනය සතු බව කරුණාවෙන් සලකන්න.

(7) නිෂ්පාදන වල යම් දෝෂයක් වෙතොත් පාරිභෝගිකයා විසින් පළමුව අදාළ ප්‍රදර්ශනාගාරය ඇමතිය යුතුය.

(8) වසර 05ක සේවා කාලය සඳහා ප්‍රථම වරට හිමිකම් පෑමෙන් පසු අලුතින් ලබා දුන් නිෂ්පාදන සඳහා සේවා කාලය හිමිවන්නේ වසර 05න් ඉතිරි කාලය සඳහා පමණි.

- (උදා :- වසර 02 කින් ප්‍රථම වරට හිමිකම් කී පසු දෙවන වරට ලබා දුන් නිෂ්පාදන සඳහා හිමිවන්නේ වසර 03 ක සේවා කාලයකි.)

## නිෂ්පාදන සඳහා කොන්දේසි

(1) i-Panel අඟල් 8 තොග කාණ්ඩ වශයෙන් නිෂ්පාදනය වන හෙයින් එහි කාණ්ඩයෙන් කාණ්ඩයට වර්ණය සහ මෝස්තරය වෙනස් විය හැක. වරින් වර මිලදී ගැනීමේදී විවිධ කාණ්ඩයන්ට අයත් නිෂ්පාදන හමුවිය හැකි අතර වෙනස් වර්ණ වලින් යුත් නිෂ්පාදන හමුවිය හැක. එම නිසා එකම කාණ්ඩ අංකය සහිත නිෂ්පාදන තොග එකම වැඩ බිමකට භාවිතා කිරීමට කටයුතු කරන්න. එලෙස භාවිතා නොකිරීම නිසා වන පැමිණිලි ආයතනය භාරනොගන්නා බව දන්වා සිටිමු.

(2) නිෂ්පාදන මාරු කිරීමකදී (මිලදී ගැනීමේදී භාණ්ඩ පළුදු වී තිබීම හෝ ඇනවුම් කල භාණ්ඩ වෙනුවට වෙනත් භාණ්ඩ ලැබීම) සවිකිරීමට ප්‍රථම එම මාරු කිරීම සිදු කර ගත යුතුය. එසේ නොමැතිව තොග සවිකිරීමකින් පසු පළුදු වී හෝ හානි වී ඇත්නම් එවැනි පැමිණිලි ආයතනය භාරනොගන්නා බව දන්වා සිටිමු.

(3) i-Panel අඟල් 8 ශීට් පාරිජම්බුල කිරණ සඳහා ඔරොත්තු නොදෙන අතර ගොඩනැගිල්ලක පිටත හිරු කිරණට නිරාවරණය වන ස්ථාන සහ හිරු කිරණ පරාවර්තනය වන ස්ථාන සඳහා භාවිතා කිරීම සිදු නොකළ යුතු අතර එලෙස භාවිතා කිරීමෙන් වන පැමිණිලි ආයතනය භාර නොගන්නා බව දන්වා සිටිමු.

(4) ප්‍රවාහනයේදී සිදුවන හානි වීම්, නිෂ්පාදන නිවැරදිව භාවිතා නොකිරීම, කහට පැල්ලම්, අධික උෂ්ණත්වයට නිරාවරණය වීම නිසා සහ ස්වාභාවික විපතකින් සිදුවන හානි වීම් සඳහා සේවා කාලය සඳහා වන සහතිකය වලංගු නොවේ.



## සවිකිරීම් සඳහා කොන්දේසි

(1) i-Panel අඟල් 8 සවිකිරීමේදී ෆිනිෂින් වහලයක් සඳහා පරාල අතර උපරිම පරතරය (මධ්‍යයේ සිට මධ්‍යයට/Center to center අඟල් 24 හෝ ඊට අඩු විය යුතුය.

(2) i-Panel අඟල් 8 සවිකිරීමේදී පැතලි සිවිලිමක් සඳහා GI අතර උපරිම පරතරය (මධ්‍යයේ සිට මධ්‍යයට/Center to center අඟල් 24 හෝ ඊට අඩු විය යුතුය.

(3) ෆිනිෂින් වහලයක් සඳහා i-Panel අඟල් 8 සවිකිරීමේදී සෙවිලි තහඩු ඇතිරීමට පෙර හිරු කිරණට නිරාවරණය නොකර තිබිය යුතු අතර සෙවිලි තහඩු හා සමගාමීව සිවිලිම සවිකර ගත යුතුය.

(4) ෆිනිෂින් වහලයක් සඳහා i-Panel අඟල් 8 සවිකිරීමේදී වහලය සහ සිවිලිම අතර පරතරය උපරිම අඟල් දෙකක් වන හෙයින් අවම සනකමින් යුත් තාප පරිවාරක භාවිතා කිරීම යෝග්‍යය වන අතර i-Roof සවිකර තිබේනම් එසේ පරිවාරක භාවිතා කිරීම අවශ්‍යය ම නොවේ. නමුත් වෙනත් සෙවිලි නිෂ්පාදනයක් භාවිතා කර තිබේ නම් 8mm Double Side තාප පරිවාරක (Aluminium Foil) භාවිතා කිරීම අවශ්‍යය වේ.

(5) හැඩ වහලයක, පල බෙදුණු වහලයක හෝ ස්ලැබ් එකක් සහිත පැතලි සිවිලිමක වහලය සහ සිවිලිම අතර පරතරය අඩි දෙකට වඩා වැඩිනම් තාප පරිවාරක (Aluminium Foil) භාවිතා කිරීම අවශ්‍යය නොවේ. අඩුනම්, 8mm Double side foil භාවිතා කිරීම අවශ්‍යය වේ.

(6) උක්ත නියමිත ප්‍රමිතීන්ට පටහැනිව සිදු කර ඇති දෝෂ සහිත කිසිඳු පැමිණිල්ලකට ආයතනය වග කියනු නොලැබේ.

(7) පැතලි සිවිලිමක් සවිකිරීමේදී සැකිල්ල සඳහා GI C Channel වෙනුවට ලී හෝ වෙනත් යමක් සමඟ ඇණ භාවිතා කිරීම සහ ලී පරාලයකට යටින් ඇණ මගින් සවිකිරීම කිසිසේත්ම නොකළ යුතුය.

(8) පරීක්ෂා කිරීමකින් පසුව නියමිත ක්‍රමවේදයන්ට පටහැනිව සවිකිරීමේ දෝෂ සහිතව සනාථ වන පැමිණිලි ආයතනය භාරනොගන්නා බවත් Idea Industries Limited මගින්, නිෂ්පාදන පමණක් නියෝජිතයන් හරහා අලෙවි කරන නිසාත් සවිකිරීමේ ශිල්පීන් යොදා ගැනීමේදී හැකිතාක් විමසිලිමත් විය යුතු බව දන්වා සිටිමු.

### හානි පූර්ණයන සඳහා කොන්දේසි

- පැමිණිලි සඳහා සෘජු හෝ වක්‍ර සවිකිරීමේ වියදම, ප්‍රවාහන වියදම සහ තෙවන පාර්ශවයක් සඳහා වන පිරිවැය සඳහා ආයතනික වගකීමක් හා දැරීමක් කිසිසේත්ම නොකෙරෙන අතර භාණ්ඩ සඳහා භාණ්ඩ පමණක් ලබා දේ.

### සේවා කාලය සඳහා අදාල කොන්දේසි

- ***i-Panel*** අඟල් 8 ශීට් සඳහා පමණක් මිලදී ගත් දින සිට වසර 05ක සේවා කාලයක් හිමි වේ.
- ***i-Panel*** සේවා කාලය සඳහා හිමිකම් ඉල්ලීමේදී ප්‍රදර්ශනාගාර මඟින් නිකුත් කරනු ලබන ඉන්වොයිස් පතේ මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.



- ***i-Panel*** ශීට් මිලදී ගැනීමේදී ***i-Panel*** වෙළෙඳ නාමය තිබේදැයි විමසිලිමත් වන්න. නිෂ්පාදනයේ ***i-Panel*** වෙළෙඳ නාමය සඳහන් නොවේ නම් අඟල් 8 ශීට් සඳහා සේවා කාලය සඳහා වන සහතිකය වලංගු නොවේ.
- සියලුම පැමිණිලි ලිඛිතව සාක්ෂි සහිතව ඉදිරිපත් කළ යුතු අතර පැමිණිල්ලකට අදාල ***i-Panel*** නිෂ්පාදනයේ තත්ත්වය නිශ්චිත වශයෙන් පරීක්ෂා කිරීමේ හා තහවුරු කිරීමේ සම්පූර්ණ හිමිකම Idea Industries ආයතනය සතු වේ.

### සේවා කාලය සඳහා සීමාවන්

- අප නිෂ්පාදන ස්වාභාවික දැව පෙනුම සහිත නිෂ්පාදන බැවින් ස්වාභාවික වර්ණ හා රටා ඉස්මතු වන ආකාරයට ශීට් ඇතිරීමට කටයුතු කරන්න. ***i-Panel*** නිෂ්පාදන සඳහා සේවා කාලය ලබා දීමේදී කිසිදු අවස්ථාවකදී වර්ණයන් හෝ මෝස්තර නොගැළපීම නිසා නිෂ්පාදන නැවත භාරගැනීම සිදුනොවන අතර එම හේතුවට අදාළව ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා ද අප ආයතනය බැඳී නොමැත.
- අප නිෂ්පාදන කාණ්ඩයන් වශයෙන් නිෂ්පාදනය වන අතර එහි කාණ්ඩයන් වෙනස් වන විට වර්ණය හා මෝස්තරය වෙනස් විය හැකි බව දන්වා සිටිමු. නියමිත ආකාරයට මිනුම් කටයුතු සිදුකර එකවර ***i-Panel*** නිෂ්පාදන මිලදී ගැනීමට හැකිතාක් කටයුතු කරන්න. වරින් වර ශීට් මිලදී ගැනීමේදී විවිධ කාණ්ඩයන්ට අයත් වෙනස් වර්ණ වලින් යුතු නිෂ්පාදන හමුවිය හැක. එමනිසා එකම කාණ්ඩ අංකය (Batch No) සහිත නිෂ්පාදන අයිතම එකම වැඩ බිමකට භාවිත කිරීමට සැලකිලිමත් වන්න.
- යම්කිසි අවස්ථාවකදී නිෂ්පාදන මාරු කරගැනීමේදී (එනම් මිලදී ගැනීමේදී භාණ්ඩ පළුදු වී තිබීම නිසා හෝ ඇණවුම් කල භාණ්ඩ නොලැබී ඒ වෙනුවට වෙනත් භාණ්ඩයක් ලැබීම) එම මාරු කරගැනීම, සවිකිරීමට පෙර සිදුකරගත යුතු අතර කිසිදු අවස්ථාවකදී සවිකිරීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගනු නොලැබේ. එසේම භාවිතා කරන ලද සහ භාවිතා කිරීමේදී හානි වී ඇති හෝ පළුදු වී ඇති ශීට් නැවත ආයතනය වෙත භාරගනු නොලැබේ.
- ***i-Panel*** ශීට් පාරජම්බුල කිරණ (Ultraviolet ray) සඳහා ඔරොත්තු නොදෙන අතර කිසිඳු අවස්ථාවක ගොඩනැගිල්ලක පිටත හිරු කිරණ සඳහා නිරාවරණය වන ස්ථාන සඳහා භාවිතා කිරීම සිදු නොකළ යුතුය.
- සවිකිරීමේ දෝෂ සඳහා කිසිදු අවස්ථාවකදී Idea Industries ආයතනය වගකියනු නොලැබේ. ***i-Panel*** ශීට් සවිකිරීම සඳහා හැකිතාක් පළපුරුදු කාර්මික ශිල්පියෙකුගේ සේවාව ලබාගන්න.
- ප්‍රවාහනයේදී සිදු වන හානි වීම් සහ නිෂ්පාදන නිවැරදිව භාවිතා නොකිරීම නිසා සිදුවන හානි වීම් සේවා කාලය සඳහා වන සහතිකය මඟින් ආවරණය නොවේ.
- ***i-Panel*** ශීට් මත යම් තද දෙයක් ගැටීම, කහට පැල්ලම් ඇති වීම, අධික උෂ්ණත්වය නිසා සිදුවන හානි හා ස්වාභාවික විපත් නිසා සිදුවන හානි යනාදිය සේවා කාලය සඳහා ඇතුලත් නොවේ.
- සවි කිරීමේදී භාවිතා කරන උපකාරක උපකරණ සේවා කාලය සඳහා වන සහතිකයෙන් ආවරණය නොවේ.
- සේවා කාලය සඳහා වන සහතිකය වලංගු වන්නේ ***i-Panel*** ශීට් සඳහා පවතින සවිකිරීමේ සම්මත උපදෙස් වලට අදාළව සවිකිරීම් කටයුතු සිදුකර ඇත්නම් පමණි.